# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1528/7 – 2007 දෙසැම්බර් 17 වැනි සඳුදා – 2007.12.17

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්ඩීබී 4/96 iii

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඕ) සහ (ක) ඡේද යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

ෆීලික්ස් පෙරේරා,
ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය.

2007 දෙසැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2002 අප්‍රේල් මස 03 වැනි දින අංක 1230/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මගින් අවසන් වරට සංශෝධිත 1998 සැප්තැම්බර් මස 14 වැනි දින අංක 1045/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1998 මත්ස්‍ය නිෂ්පාදන (අපනයන) නියෝගවල "ඉ" උපලේඛනයේ "විශේෂිත පිරික්සුම්" යන ශීර්ෂය යටතේ ඇති 5 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන් එම නියෝග මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

"(5) මසුන්ගේ සහ මත්ස්‍ය නිෂ්පාදන වල ඇති ලෙඩ්, කැඩ්මියම් සහ ම'කරි (රසදිය) සඳහා උපරිම සීමා :

(1) නිසි බලධරයා විසින් මසුන්ගේ සහ මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ පැවතිය හැකි ලෙඩ්, කැඩ්මියම් සහ ම'කරි (රසදිය) ප්‍රමාණයන් සඳහා අගයන් නිර්ණය කිරීමේදී "උපරිම මට්ටම" යන තීරයේ දක්වා ඇති අගයයන් අනුමත කල හැකි උපරිම සීමා වශයෙන් සලකනු ලබන අතර, පහත දක්වා ඇති නිෂ්පාදනයන් තුළ ඉහත ද්‍රව්‍යයන් එම "උපරිම මට්ටම" ඉක්මවා අන්තර්ගත නොවිය යුතුය.

| | *නිෂ්පාදනය* | *උපරිම මට්ටම් කෙන් බර (මිලිග්‍රෑම්/කි.ග්‍රෑම්)* |
|---|---|---|
| ලෙඩ් (Pb) | පහත ලැයිස්තුගත කර ඇති මත්ස්‍ය විශේෂයන් හැර අනෙකුත් මත්ස්‍ය විශේෂයන්ගේ මාංශ ([1])([2]) | 0.20 |
| | පහත සඳහන් මත්ස්‍ය විශේෂයන්ගේ මාංශ ([1])([2])<br>(1) කොමන් වූ බැන්ඩඩ් සී බ්‍රීම් (ඩිප්ලෝඩස් වල්ගාරිස්)<br>(2) ආඳා (ඇන්ගුයිලා ඇන්ගුයිලා)<br>(3) ග්‍රේ මුලට් (මුගිල් ලැබ්රෝසස් ලැබ්රෝසස්)<br>(4) ග්‍රන්ට් (පොමාඩේසිස් බිනෙට්)<br>(5) හෝස් මැකරල්/ස්කැඩ් (ට්‍රැචුරස් ට්‍රැචුරස්)<br>(6) සාඩීන් (සාඩිනා පිල්චාඩස්)<br>(7) සාඩිනෝප්ස් (සාඩිනෝප්ස් විශේෂ)<br>(8) ස්පොටඩ් සීබාස් (ඩයිසෙන්ට්‍රාචස් පන්ක්ටේටස්)<br>(9) වෙජ් සෝල් (ඩයිකොලොගොග්ලෝසා කුනියෝටා) | 0.40 |
| | කකුළුවන්ගේ දුඹුරු පැහැ මාංශ හා පොකිරිස්සන් හා ඒ හා සමාන විශාල ක්‍රස්ටේෂියාවන්ගේ (නෙප්රොයිඩේ සහ පැලිනියුරිඩේ) හිස සහ උරස් මාංශ හැර, ක්‍රස්ටේෂියාවන් | 0.50 |
| | ද්විකපාටික මොලුස්කාවන් | 1.50 |
| | සෙපලොපොඩාවන් (අන්තරාංග රහිතව) | 1.00 |
| කැඩ්මියම් (Cd) | පහත ලැයිස්තුගත කර ඇති මත්ස්‍ය විශේෂයන් හැර අනෙකුත් මත්ස්‍ය විශේෂයන්ගේ මාංශ ([1])([2]) | 0.05 |
| | පහත සඳහන් මත්ස්‍ය විශේෂයන්ගේ මාංශ ([1])([2])<br>(1) ඇන්චොවි (එන්ග්‍රෝලිස් විශේෂ)<br>(2) බොනිටෝ (සාඩා සාඩා)<br>(3) කොමන් වූ බැන්ඩඩ් සී බ්‍රීම් (ඩිප්ලෝඩස් වල්ගාරිස්)<br>(4) ආඳා (ඇන්ගුයිලා ඇන්ගුයිලා)<br>(5) ග්‍රේ මුලට් (මුගිල් ලැබ්රෝසස් ලැබ්රෝසස්)<br>(6) හෝස් මැකරල්/ස්කැඩ් (ට්‍රැචුරස් ට්‍රැචුරස්)<br>(7) ලෝචා (ර්) හෝ ලූචා (ර්) (ලූචාරස් ඉම්පීරියාලිස්)<br>(8) සාඩීන් (සාඩිනා පිල්චාඩස්)<br>(9) සාඩිනෝප්ස් (සාඩිනෝප්ස් විශේෂ)<br>(10) ටූනා (තුන්නුස් ඉයුතින්නිස් විශේෂ, කට්සුවොනස් පෙලාමිස්)<br>(11) වෙජ් සෝල් (ඩයිකොලොගොග්ලෝසා කුනියේටා) | 0.10 |
| | ස්වෝඩ් පිෂ් (කඩුකොප්පරා) මාංශ (ක්සිපියස් ග්ලැඩියස්) | 0.30 |
| | කකුළුවන්ගේ දුඹුරු පැහැ මාංශ හා පොකිරිස්සන් හා ඒ හා සමාන විශාල ක්‍රස්ටේෂියාවන්ගේ (නෙප්රොයිඩේ සහ පැලිනියුරිඩේ) හිස සහ උරස් මාංශ හැර, ක්‍රස්ටේෂියාවන් | 0.50 |
| | ද්විකපාටික මොලුස්කාවන් | 1.00 |
| | සෙපලොපොඩාවන් (අන්තරාංග රහිතව) | 1.00 |
| ම(ර්)කරි (Hg) | පහත ලැයිස්තුගත කර ඇති මත්ස්‍ය විශේෂයන් හැර අනෙකුත් මත්ස්‍ය විශේෂයන්ගේ මාංශ ([1])([3]) | 0.50 |
| | පහත සඳහන් මත්ස්‍ය විශේෂයන්ගේ මාංශ ([1])([2])<br>(1) ඇන්ග්ල(ර්) පිෂ් (ලෝපියස් විශේෂ)<br>(2) අත්ලාන්තික් කැට් පිෂ් (අනාහිචස් ලූපස්)<br>(3) බොනිටෝ (සාඩා සාඩා)<br>(4) ආඳා (ඇන්ගුයිලා ඇන්ගුයිලා)<br>(5) එම්පර(ර්), ඔරේන්ජ් රෆි, රෝසි සෝල්ජර් පිෂ් (හොප්ලොස්ටිතස් විශේෂ) | 1.00 |

| | නිෂ්පාදනය | උපරිම මට්ටම් තෙත් බර (මිලිග්‍රෑම්/කි.ග්‍රෑම්) |
|---|---|---|
| | (6) ග්‍රෙනේඩිය(ර්) (කොරිපිනොයිඩ්ස් රූපෙස්ට්‍රිස්) | |
| | (7) හැලිබට් (හිපොග්ලෝසස් හිපොග්ලෝසස්) | |
| | (8) මා(ර්)ලින් (මැකයිරා විශේෂ) | |
| | (9) ම(ර්)ග්‍රීම් (ලෙපිඩොහෝම්බස් විශේෂ) | |
| | (10) මුලට් (මුලස් විශේෂ) | |
| | (11) පයික් (එසොක්ස් ලුසියස්) | |
| | (12) ප්ලේන් බොනිටෝ (ඕසිනොප්සිස් යුනිකොල(ර්) | |
| | (13) පුවර් කොඩ් (ට්‍රයිකොප්ටෙරස් මිනුටිස්) | |
| | (14) පෝචුගීස් ඩෝග් පිෂ් (සෙන්ට්‍රො සිම්නස් කෝලොලෙපිස්) | |
| | (15) රේස් (රාජා විශේෂ) | |
| | (16) රෙඩ් පිෂ් (සෙබාස්ටස් මැරිනස්, සෙබාස්ටස් මැන්ටිලා, සෙබාස්ටස් විවිපැරස්) | |
| | (17) සේල් පිෂ් (ඉස්ටියෝපොරස් ප්ලැටිප්ටෙරස්) | |
| | (18) සබාඩ් පිෂ් (ලෙපිඩෝපස් කෝඩාටස්, ඇපනෝපස් කා(ර්)බෝ) | |
| | (19) සී බ්‍රීම්, පැන්ඩෝරා (පැජෙලස් විශේෂ) | |
| | (20) ෂාක් (සියලු විශේෂ) | |
| | (21) ස්නේක් මැකරල් හෝ බට(ර්) පිෂ් (ලෙපිඩොසයිබියම් ෆේවොබෑනියම්, රුවේටස් ප්‍රිටියෝසස්, ජෙම්පිලස් ස(ර්)පෙන්ස්) | |
| | (22) ස්ට(ර්)ජන් (ඇසිපෙන්සර් විශේෂ) | |
| | (23) ස්වෝඩ් පිෂ් (ක්සිපියස් ග්ලැඩියස්) | |
| | (24) ටූනා (තුන්නුස්, ඉයුතින්නිස් විශේෂ, කට්සුවෝනස් පෙලාමිස්) | |

([1]) මත්ස්‍යයින් සම්පූර්ණයෙන්ම ආහාරයට ගනු ලබන අවස්ථාවකදී උපරිම සීමා, සම්පූර්ණ මත්ස්‍යයින් සඳහා අදාළ වේ.

([2]) සජීවී මසුන්, අළුත් හෝ ශීතකළ මසුන්, හිමායනය කළ මසුන්, මත්ස්‍ය තීරු සහ වෙනත් අළුත් ශීතකල හෝ හිමායනය කළ මත්ස්‍ය මාංශ (අඹරන ලද හෝ අඹරනු ලබා නොමැති).

([3]) සජීවී මසුන්, අළුත් හෝ ශීතකළ මසුන්, හිමායනය කළ මසුන්, මත්ස්‍ය තීරු සහ වෙනත් අළුත් ශීතකළ හෝ හිමායනය කළ මත්ස්‍ය මාංශ (අඹරන ලද හෝ අඹරනු ලබා නොමැති).

කවච සහිත හෝ රහිත, සජීවී, අළුත්, ශීතකළ හිමායනය කළ, වියලන ලද, ලුණු දැමූ හෝ ලවණ ජලයේ බහාලූ, කවච සහිත මසුන් වාෂ්පයෙන් හෝ නටන ජලයෙහි පිසින ලද, ශීතකළ හිමායනය කළ වියලනු ලැබූ, ලුණු දැමූ හෝ ලවණ ජලයේ බහාලූ හෝ එසේ නොකරනු ලැබූ කවච සහිත මසුන් (ක්‍රස්ටේෂියාවන්) ; මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු මත්ස්‍යයින්ගේ පිටි, ආහාර සහ පෙලට්.

කවච සහිත හෝ රහිත, සජීවී, අළුත්, ශීතකළ, හිමායනය කළ, වියලන ලද, ලුණු දැමූ හෝ ලවණ ජලයේ බහාලූ මෘද්වංශිකයන් (මොලුස්කාවන්) : කවච සහිත මසුන් (ක්‍රස්ටේෂියාවන්) හැර වෙනත් ජලජ අපෘෂ්ඨ වංශිකයන්ගේ, මනුෂ්‍ය ආහාරයට සුදුසු පිටි, ආහාර සහ පෙලට්.

සකස් කරන ලද හෝ සංරක්ෂණය කරන ලද කවච සහිත මසුන් (ක්‍රස්ටේෂියාවන්) ; මෘද්වංශිකයන් (මොලුස්කාවන්) සහ අනෙකුත් ජලජ අපෘෂ්ඨ වංශිකයන්.

(2) මත්ස්‍ය නිෂ්පාදනයන් තුළ පැවතිය හැකි ලෙඩ්, කැඩ්මියම් සහ ම(ර්)කරි (රසදිය) මට්ටම් නිල වශයෙන් පාලනය කිරීම සඳහා නියැදි ලබා ගැනීමේ ක්‍රම :–

(අ) අරමුණු සහ පරාසය

මත්ස්‍ය නිෂ්පාදනයන් තුළ පැවතිය හැකි ලෙඩ්, කැඩ්මියම් හා ම(ර්)කරි (රසදිය) මට්ටම් නිල වශයෙන් පාලනය කිරීම සඳහා ලබාගන්නාවූ නියැදි පහත විස්තර කෙරෙන ක්‍රමයන්ට අනුව ලබාගත යුතුය. මේ අනුව ලබා ගන්නා සමස්ත නියැදි එම නියැදි ලබාගත් සමූහයන් හෝ උප සමූහයන්ගේ නියෝජනයන් ලෙස සලකනු ලැබිය හැක. මෙම නියෝග මගින් පනවනු ලැබූ උපරිම සීමාවන්ට දක්වන අනුකූලතාවය, පර්යේෂණාගාර නියැදි මගින් නිශ්චය කරන්නා වූ මට්ටම් පදනම් කොටගෙන තහවුරු කළ යුතු ය.

(ආ) අර්ථ දැක්වීම

1. සමූහය – සම්භවය, ප්‍රභේදය, ඇසුරුම් වර්ගය, ඇසුරුම්කරු, බඩු යවන්නා හෝ සලකුණු වැනි පොදු ගුණාංග තිබීම මත බලය ලත් නිලධරයකු විසින් තීරණය කරන්නා වූ හඳුනාගත හැකි සහ එක් අවස්ථාවකදී බෙදා හැරෙන ආහාර ප්‍රමාණයක් සමූහයක් වශයෙන් හැඳින්වේ. මත්ස්‍යයින් සම්බන්ධයෙන් සැලකීමේදී මත්ස්‍යයින්ගේ විශාලත්වය ද එකිනෙකට සංසන්දනාත්මක විය යුතු ය.

2. උප සමූහය – නියැදි ලබා ගැනීමේ ක්‍රමය යම් නියම කරනු ලබන කොටසකට යොදාගනු පිණිස, තෝරාගත්, විශාල සමූහයක එම නියම කරනු ලැබූ කොටස උප සමූහය ලෙස හැඳින්වේ. සෑම උප සමූහයක් ම භෞතිකව වෙන්ව තිබිය යුතු අතර හඳුනාගත හැකි විය යුතු ය.

3. වර්ධිත නියැදිය – සමූහයේ හෝ උපසමූහයේ එක් ස්ථානයකින් ලබාගනු ලබන ද්‍රව්‍ය ප්‍රමාණය.

4. සමස්ත නියැදිය – සමූහයේ හෝ උපසමූයෙන් ලබාගනු ලබන සියලු වර්ධිත නියැදිවල සමස්ත එකතුව.

5. පර්යේෂණාගාර නියැදිය – පරීක්ෂා කිරීම සඳහා පර්යේෂණාගාරය වෙත යැවීමට අපේක්ෂිත නියැදිය.

(ඇ) සාමාන්‍ය විධිවිධාන

1. කාර්ය මණ්ඩලය

නිසි බලධාරයා විසින් එම කාර්යය සඳහා නම් කරනු ලබන, සුදුසුකම් ලත්, බලයලත් තැනැත්තකු විසින් නියැදි ලබා ගැනීම කළ යුතු ය.

2. නියැදි ලබාගත යුතු ද්‍රව්‍යය

පරීක්ෂා කළ යුතු සෑම සමූහයකම වෙන් වශයෙන් නියැදි ලබාගත යුතු ය.

3. ගත යුතු පූර්ව අවධානය

නියැදි ලබාගැනීමේ සහ පර්යේෂණාගාර නියැදි සකස් කිරීමේ ක්‍රියාවලියේදී ලෙඩ්, කැඩ්මියම් සහ ම(ර්)කරි (රසදිය) අන්තර්ගතයට අහිතකර ලෙස බලපෑම් ඇති කළ හැකි යම් වෙනස් වීමක් වෙතොත් එය වැලැක්වීමට ද, විශ්ලේෂණාත්මක නිශ්චයක් කිරීමට බලපෑම් ඇති කළ හැකි හෝ සමස්ත නියැදියේ නියෝජනාත්මක භාවයට බලපෑම් ඇති කළ හැකි යම් වෙනස් වීමක් වෙතොත් එය වැළැක්වීමට ද අවශ්‍ය සෑම පූර්ව අවධානයක් ම ගනු ලැබිය යුතුය.

4. වර්ධිත නියැදි

වර්ධිත නියැදි හැකිතාක් දුරට ප්‍රායෝගික වන පරිදි සමූහයක් හෝ උපසමූයක් පුරා පැතිරී ඇති විවිධ ස්ථානවලින් ලබාගත යුතු ය. මෙම ක්‍රියා පටිපාටියෙන් වෙනස් වන අවස්ථා "සාමාන්‍ය විධිවිධාන" යන ශීර්ෂය යටතේ වූ 8 වැනි අයිතමයේ සඳහන් වන ලේඛනයෙහි සටහන් කළ යුතු ය.

5. සමස්ත නියැදි පිළියෙල කිරීම

සියලු වර්ධිත නියැදි මිශ්‍ර කිරීමෙන් සමස්ත නියැදිය සාදනු ලැබේ. හැකිතාක් දුරට ප්‍රායෝගික වන අවස්ථාවලදී එය අවම වශයෙන් කිලෝ ග්‍රෑම් 1 ක් විය යුතු ය. උදා – එක් ඇසුරුමක් නියැදිය ලෙස තබාගනු ලැබ ඇති අවස්ථාවකදී.

6. බලාත්මක කිරීම, විත්තිවාචක සහ විනිශ්චය අරමුණු කොට ගෙන පර්යේෂණාගාර නියැදිවල ඇති සමස්ත නියැදිය අනුරූ කොටස්වලට බෙදීම

නියැදි ලබාගැනීමේ නියෝගවලට පටහැනි නොවන්නේ නම් බලාත්මක කිරීම (වෙළඳ), විත්තිවාචක සහ විනිශ්චය අරමුණු කර ගත් පර්යේෂණාගාර නියැදි සමජාතිය කරනු ලැබූ සමස්ත නියැදියෙන් ලබාගත යුතු ය. බලාත්මක කිරීමේ අරමුණින් ලබාගන්නා පරීක්ෂණාගාර නියැදිය අවම වශයෙන් විශ්ලේෂණ වාර දෙකක් සඳහා ප්‍රමාණවත් විය යුතු ය.

7. සමස්ත සහ පර්යේෂණාගාර නියැදි ඇසුරුම් කිරීම සහ සම්ප්‍රේෂණය කිරීම

සෑම සමස්ත නියැදියක් ම සහ පර්යේෂණාගාර නියැදියක් ම, දූෂක ද්‍රව්‍ය එක්වීමෙන්, බඳුනේ අභ්‍යන්තර බිත්ති මගින් අවශෝෂණය කිරීම හේතුවෙන් විශ්ලේෂක ද්‍රව්‍යයන් හීන වීමෙන් සහ ගෙනයාමේදී සිදුවන හානිය මගහැරීමට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබාදෙන පිරිසිදු, අක්‍රිය බඳුනක තැන්පත් කළ යුතු ය. ප්‍රවාහනයේ දී සහ ගබඩා කිරීමේදී සමස්ත සහ පර්යේෂණාගාර නියැදිවල සංයුතියෙහි සිදුවිය හැකි වෙනස්කම් වැළැක්වීමට අවශ්‍ය පූර්ව ක්‍රියා මාර්ග ගත යුතු ය.

8. සමස්ත සහ පර්යේෂණාගාර නියැදි මුද්‍රා තැබීම සහ ලේබල් කිරීම

නිල කටයුතු සඳහා ලබාගන්නා සෑම නියැදියක්ම විධිමත් අවශ්‍යතාවයන් අනුව යමින් නියැදි ලබා ගන්නා ස්ථානයේ දී ම මුද්‍රා තැබිය යුතු ය. සෑම නියැදි ලබාගැනීමක දී ම, සෑම සමූහයක්ම පැහැදිලිව හඳුනාගනු ලැබීම පිණිස, නියැදි ලබාගත් දිනය සහ ස්ථානය ද සමගින් විශ්ලේෂකයාට සහය පිණිස වියහැකි අතිරේක තොරතුරු ද සමග ලේඛන ගත කළ යුතු ය.

(ඇ) නියැදි ලබාගැනීමේ සැලසුම්

ස්වායත්ත සමූහය හඳුනාගැනීමට හැකිවන සහ නිෂ්පාදනය ආහාර දාමයට එක්වන්නා වූ ස්ථානයේ දී වඩාත් යෝග්‍ය අයුරින් නියැදි ලබා ගැනීම සිදුවිය යුතු ය. පාලනය කළ යුතු සමූහය, ලබාගන්නා සමස්ත නියැදියෙන් නියෝජනය වන බව භාවිතා කරන නියැදි ලබා ගැනීමේ ක්‍රමය මගින් තහවුරු කළ යුතු ය.

වර්ධිත නියැදි සංඛ්‍යාව

සමූහයකින් ලබාගත යුතු අවම වර්ධිත නියැදි සංඛ්‍යාව 1 වැනි වගුවෙහි දක්වනු ලැබ ඇත. වර්ධිත නියැදි සමාන බරකින් යුක්ත විය යුතු ය. මෙම ක්‍රියා පටිපාටියෙන් වෙනස්වන අවස්ථාවන් "සාමාන්‍ය විධිවිධාන " යන ශීර්ෂය යටතේ වූ 8 වැනි අයිතමයේ සඳහන් වන ලේඛනයෙහි සටහන් කළ යුතු ය.

වගුව 1 : සමූහයකින් ලබාගත යුතු අවම වර්ධිත නියැදි සංඛ්‍යාව

| *සමූහයේ මුළු බර (කි. ග්‍රෑ.)* | *ලබාගත යුතු අවම වර්ධිත නියැදි සංඛ්‍යාව* |
|---|---|
| <50 | 3 |
| 50 සිට 500 දක්වා | 5 |
| >500 | 10 |

නිෂ්පාදන සමූහය වෙන් වෙන් ඇසුරුම්වලින් සමන්විත වන්නේ නම් සමස්ත නියැදියක් සෑදීම සඳහා ගත යුතු ඇසුරුම් සංඛ්‍යාව 2 වැනි වගුවෙහි දක්වා ඇත.

වගුව 2 : සමූහය වෙන් වෙන් ඇසුරුම්වලින් සමන්විත වන්නේ නම් සමස්ත නියැදියක් සෑදීම සඳහා ගතයුතු ඇසුරුම් (වර්ධිත නියැදි) සංඛ්‍යාව

| *සමූහය තුළ ඇති ඇසුරුම් හෝ ඒකක ගණන* | *ලබාගත යුතු ඇසුරුම් හෝ ඒකක ගණන* |
|---|---|
| 1 සිට 25 දක්වා | ඇසුරුම් හෝ ඒකක 1 ක් |
| 26 සිට 100 දක්වා | 5% ක් පමණ, අවම වශයෙන් ඇසුරුම් හෝ ඒකක 2 ක් |
| >100 | 5% ක් පමණ, උපරිම වශයෙන් ඇසුරුම් හෝ ඒකක 10 ක්. |

(ඈ) සමූහය හෝ උපසමූහය පිරිවිතරවලට දක්වන අනුකූලතාවය

බලාත්මක කිරීම සඳහා වන පර්යේෂණ නියැදිය අනුමත හෝ බලයලත් පර්යේෂණාගාරයන් විසින් අවම වශයෙන් ස්වාධීන විශ්ලේෂණ 2 ක් ලෙසින් විශ්ලේෂණය කළ යුතු අතර එම ප්‍රතිඵලයන්ගේ සාමාන්‍ය ගණනය කළ යුතු ය . මෙම නියෝග මගින් පනවා ඇති අදාළ උපරිම මට්ටම් එම ප්‍රතිඵලයන්ගේ සාමාන්‍යයට අනුකූල වන්නේ නම් පමණක් එම නිෂ්පාදන සමූහය අනුමත කරනු ලැබේ. ඉහත සාමාන්‍යය අදාළ උපරිම මට්ටම ඉක්මවා යන්නේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(3) මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ ලෙඩ්, කැඩ්මියම් සහ ම(ර්)කරි (රසදිය) සීමාවන් නිල වශයෙන් පාලනය කිරීම් සඳහා නියැදි සකස් කිරීම සහ යොදාගන්නා විශ්ලේෂණ ක්‍රම සඳහා නිර්නායක

(අ) හැඳින්වීම

මූලික අවශ්‍යතාවය වන්නේ ද්විතීය දූෂක එක්වීමෙන් තොරව නියෝජනාත්මක සහ සමජාතීය පරීක්ෂණාගාර නියැදියක් ලබා ගැනීමයි.

(ආ) ලෙඩ්, කැඩ්මියම් සහ ම(ර්)කරි (රසදිය) සඳහා විශේෂිත නියැදි සකස් කිරීමේ පටිපාටි

සලකා බැලෙන නිෂ්පාදනයන් සඳහා යොදා ගනු ලැබිය හැකි විශේෂිත නියැදි සකස් කිරීමේ පටිපාටි බොහෝ සංඛ්‍යාවක් ඇත. "ආහාර ද්‍රව්‍යයන් සඳහා සීර්එන්, (CEN) ප්‍රමිති - අංශුමාත්‍ර මූල ද්‍රව්‍ය නිශ්චය කිරීම - ක්‍රියාත්මක කිරීමේ නිර්ණායක හා සාමාන්‍ය කරුණු " පිළිබඳ කෙටුම්පතෙහි සවිස්තර කර ඇති පටිපාටි ප්‍රමාණවත් බැව් තහවුරු වී ඇති අතර කෙසේ වුව ද අනෙකුත් පටිපාටි ද ඒ හා සමානව වලංගුවේ.

කුමන පටිපාටිය යොදාගනු ලැබුව ද පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතු ය.

ද්විකපාටික මෑද්වංශීන්, කවච සහිත මසුන් සහ කුඩා මසුන් ; සාමාන්‍යයෙන් මොවුන් සම්පූර්ණයෙන්ම ආහාරයට ගනු ලබන බැවින්, විශ්ලේෂණය කරනු ලබන ද්‍රව්‍යයන්ට අන්තරංගද ඇතුළත් විය යුතු ය.

(ඇ) පර්යේෂණාගාරය විසින් භාවිතා කරනු ලැබිය යුතු විශ්ලේෂණ ක්‍රම සහ පර්යේෂණාගාර පාලිත තත්ත්ව

(i) අර්ථ දැක්වීම

පර්යේෂණාගාරයන් විසින් පොදුවේ වැඩි වශයෙන් යොදා ගනු ලබන අර්ථ දැක්වීම් ගණනාවක් පහත දක්වා ඇත.

(අ) ආර්(r) - පුනරාවර්තතාව, පුනරාවර්තතා තත්ත්වයන් තනි වශයෙන් ලබාගත් පරීක්ෂණාගාර දත්ත දෙකක නිරපේක්ෂ වෙනසට පහල අගය (එනම් එකම නියැදිය, එකම ක්‍රියාකරු සහ එකම උපකරණය, එකම පර්යේෂණාගාරය සහ කුඩා කාල පරාසයක්) නියත සම්භාවිතාවයක් (දර්ශීයව 95% ක්) තුළ පවතී යයි අපේක්ෂා කෙරෙන අතර සහ එබැවින් ආර්(r)= 2.8x එස්ආර්($S_r$)වේ.

(ආ) එස්ආර්($S_r$) – පුනරාවර්තතා තත්ත්ව යටතේ උත්පාදනය කළ ප්‍රතිඵලයන්ගෙන් ගණනය කළ සම්මත අපගමනය.

(ඇ) ආර්එස්ඩීආර්($RSD_r$) - පුනරාවර්තතා තත්ත්ව යටතේ උත්පාදනය කළ ප්‍රතිඵලවලින් ගණනය– කළ සාපේක්ෂ සම්මත අපගමනය (එස්ආර්($S_r$) / එක්ස් බා(ර්) ($\bar{X}$) x 100). මෙහි එක්ස් බා(ර්) ($\bar{X}$) යනු සියලුම පර්යේෂණාගාරයන්ගේ සහ නියැදිවල ප්‍රතිඵලවල සාමාන්‍යය වේ.

(ඈ) ආ(ර්)(R) - ප්‍රතිනිෂ්පාද්‍යතාව, ප්‍රතිනිෂ්පාද්‍යතා තත්ත්ව යටතේ තනි වශයෙන් ලබාගත් පර්යේෂණාගාර දත්තයන්ගේ නිරපේක්ෂ වෙනසට පහළ අගය (එනම් වෙනස් පර්යේෂණාගාරයන්ගේ ක්‍රියාකරුවන් විසින් ලබාගත් සමාන ද්‍රව්‍යයන්, සම්මත පරීක්ෂණ ක්‍රමයක් යොදා ගනිමින් ලබාගත්) මෙය නිශ්චිත සම්භාවිතාවක් (දර්ශීයව 95% ක්) තුළ පවතී යයි අපේක්ෂා කෙරේ. ආර්(R)=2.8 x එස්ආර්($S_r$).

(ඉ) එස්ආර්($S_r$)- - ප්‍රතිනිෂ්පාද්‍යතා තත්ත්ව යටතේ ලබාගත් ප්‍රතිඵලවලින් ගණනය කළ සම්මත අපගමනය.

(ඊ) ආර්එස්ඩීආර් ($RSD_R$) – ප්‍රති නිෂ්පාදනතා තත්ත්ව යටතේ උත්පාදනය කළ ප්‍රතිඵලයන්ගෙන් ගණනය කල සාපේක්ෂ සම්මත අපගමනය (එස්ආර් ($S_R$)/එක්ස් බා(ර්)($\bar{X}$)x100)

(උ) හොරාට්(ආර්)=$HORRAT_R$) - ආර්=0.66 ආර් (r=0.66R) යයි උපකල්පනය කරමින් හෝවිට්ස් (Horwitz) සමීකරණය යොදා ගනිමින් තක්සේරු කරනු ලැබූ ආර්එස්ඩී(ආර්) අගයෙන්, නිරීක්ෂණය කළ ආර්එස්ඩී $_{(ආර්)}$ අගය බෙදූ විට ලැබෙන අගය.

(ඌ) හොරාට්(ආර්)=($HORRAT_R$) - හෝවිට්ස් සමීකරණය යොදා ගනිමින් ගණනය කළ ආර්එස් ඩී$_{(ආර්)}$ අගයෙන් නිරීක්ෂිත ආර්එස්ඩී(ආර්) බෙදූ විට ලැබෙන අගය.

(ii) සාමාන්‍ය අවශ්‍යතා :

පාලනය කිරීමේ අවශ්‍යතාවය මත භාවිතා කරනු ලබන විශ්ලේෂණ ක්‍රම හැකි අවස්ථාවන්හි දී, 85/591/EEC නියෝගයෙහි එන උපලේඛනයෙහි 1 හා 2 ඡේදයන්හි අන්තර්ගත විධිවිධානවලට අනුකූල විය යුතු ය.

(iii) විශේෂිත අවශ්‍යතා :

ලෙඩ්, කැඩ්මියම් සහ ම(ර්)කරි (රසදිය) විශ්ලේෂණ

ලෙඩ්, කැඩ්මියම් සහ ම(ර්)කරි (රසදිය) අන්තර්ගතයන් නිශ්චය කිරීම සඳහා විශේෂිත ක්‍රම නියම කර නොමැත. පර්යේෂණාගාරය විසින් 3 වැනි වගුවෙහි දක්වා ඇති කාර්ය සාධන නිර්නායක සම්පූර්ණ කරන සත්‍යායනය කරනු ලැබූ ක්‍රමයක් භාවිතා කළ හැක. හැකි අවස්ථාවන්හි දී, සහයෝගී පෙරහුරු පරීක්ෂා ද්‍රව්‍යයන් ලෙස, සහතික කරනු ලැබූ විමර්ශන ද්‍රව්‍යයන් යොදා ගැනීම ද සත්‍යායනය කිරීමට අයත් වේ.

වගුව 3– . ලෙඩ්, කැඩ්මියම් සහ ම(ර්)කරි (රසදිය) පරීක්ෂා සඳහා කාර්ය සාධන නිර්ණායක :

| *පරාමිතිය* | *අගය/අර්ථ කථනය* |
|---|---|
| අදාළවීම | මෙම නියෝගයන්හි නියම කරනු ලැබ ඇති මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන සඳහා. |
| අනාවරන සීමාව | ලෙඩ් සඳහා නියම කර ඇති අගය 0.1 මි. ග්‍රෑ./ කි. ග්‍රෑ. ට වඩා අඩු වන අවස්ථාවක දී හැර, මෙම නියෝගයන්හි පිරිවිතරවල දක්වා ඇති අගයෙන් දහයෙන් එකකට වඩා නොවැඩි විය යුතු ය. පසුව සඳහන් කර ඇති ඒවා සඳහා පිරිවිතරවල දක්වා ඇති අගයෙන් පහෙන් එකකට වඩා නොවැඩි විය යුතු ය. |
| ප්‍රමාණන සීමාව | ලෙඩ් සඳහා නියම කර ඇති අගය 0.1 මි. ග්‍රෑ./කි.ග්‍රෑ. ට වඩා අඩු වන අවස්ථාවක දී හැර, මෙම නියෝගයන්හි පිරිවිතරවල දක්වා ඇති අගයෙන් පහෙන් එකකට වඩා නොවැඩි විය යුතු ය. පසුව සඳහන් කර ඇති ඒවා සඳහා පිරිවිතරවල දක්වා ඇති අගයෙන් පහෙන් දෙකකට වඩා නොවැඩි විය යුතු ය. |
| නත්‍යතාව | සත්‍යායනය කිරීම සඳහා සහයෝගී පෙරහුරුවේදී 1.5 ට වඩා අඩු හොරාට්(ආර්)($HORRAT_r$) හෝ හොරාට්(ආර්)($HORRAT_R$) අගයයන්. |
| ප්‍රලාභය | 80-120% (සහයෝගී පෙරහුරුවේ දක්වා ඇති පරිදි) |
| විශිෂ්ටතාව | පූරකය හෝ වර්ණාවලිමය බලපෑම් වලින් තොරව. |

(iv) විශ්ලේෂණාත්මක නිරවද්‍යතාවය සහ ප්‍රලාභ ගණනය කිරීම් තක්සේරු කිරීම

අවස්ථාවෝචිත පරිදි සුදුසු සහතික කරනු ලැබූ විමර්ශන ද්‍රව්‍යයන් විශ්ලේෂණයන් සඳහා යොදා ගනිමින් විශ්ලේෂණයේ නිරවද්‍යතාවය තක්සේරු කළ යුතු වේ.

අයි යූපී ඒ සී/අයිඑස්ඕ / ඒඕ ඒසී (IUPAC/ISO/AOAC) අනුග්‍රහයෙන් වැඩි දියුණු කරන ලද "විශ්ලේෂණ මිණුම්වලදී ප්‍රලාභ තොරතුරු භාවිතා කිරීම පිළිබඳ වූ ඒකමතික මාර්ග සූචක " සැලකිල්ලට ගත යුතු වේ. විශ්ලේෂණාත්මක ප්‍රතිඵල නිරවද්‍ය කර හෝ නිරවද්‍ය නොකර වාර්තා කළ යුතු ය. වාර්තා කරනු ලබන ආකාරය හා ප්‍රලාභයේ මට්ටම වාර්තා කළ යුතු ය.

(v) පර්යේෂණාගාර තත්ත්ව සඳහා ප්‍රමිතීන්.

පර්යේෂණාගාර, 93/99/ඊඊසී (93/99/EEC) නියෝගයට හෝ ඒ සමාන තත්ත්වයන්ට අනුකූල විය යුතු ය.

(vi) ප්‍රතිඵල ප්‍රකාශ කිරීම :

මෙම නියෝගයන්ගේ උපරිම මට්ටම් සඳහා පනවා ඇති ඒකකයන්ම ප්‍රතිඵල ප්‍රකාශ කිරීම සඳහා ද යොදාගත යුතු වේ.

01-44

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
அதி விசேஷமானது
අංක 1528/7 - 2007 දෙසැම්බර් 17 වැනි සඳුදා - 2007.12.17
1528/7 ஆம் இலக்கம் - 2007 ஆம் ஆண்டு திசெம்பர் மாதம் 17 ஆந் திகதி திங்கட்கிழமை
(அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)

# பகுதி I : தொகுதி (I) - பொது

## அரசாங்க அறிவித்தல்கள்

ச. வ. பீ. 4/96 III.

### 1996 ஆம் ஆண்டின் 2 ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் சட்டம்

1996 ஆம் ஆ
ண்டின் 2 ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் சட்டத்தின் 61 ஆவது பிரிவின் (1) ஆவது உட்பிரிவின் (ஔ) மற்றும் (க) என்னும் பந்திகளின்கீழ் கடற்றொழில், நீரியல் வளங்கள் அமைச்சரினால் ஆக்கப்பட்ட ஒழுங்குவிதிகள்.

பீலிக்ஸ் பெரேரா,
கடற்றொழில், நீரியல் வளங்கள் அமைச்சர்.

கொழும்பு,
2007, திசெம்பர் 6.

#### ஒழுங்குவிதிகள்

1998, ஏப்பிறல் 3 ஆம் திகதிய 1045/1 ஆம் இலக்க அதிவிசேட வர்த்தமானியில் வெளியிடப்பட்டவையும் 2002, ஏப்பிறல் 3 ஆந் திகதிய 1230/14 ஆம் இலக்க அதிவிசேட வர்த்தமானியில் வெளியிடப்பட்ட ஒழுங்குவிதிகளால் கடைசியாகத் திருத்தப்பட்டவையுமான 1998 ஆம் ஆண்டின் மீன் உற்பத்திப் பொருட்கள் (ஏற்றுமதி) ஒழுங்குவிதிகள் அதன் அட்டவணை (உ) என்பதில் "விசேட சரிபார்த்தல்கள்" என்னும் தலைப்பின்கீழ் காணப்படும் இனம் (5) என்பதற்குப் பதிலாகப் பின்வரும் புதிய இனத்தை இடுவதன்மூலம் இத்தால் மேலும் திருத்தப்படுகின்றன.

"5. மீன் மற்றும் மீன் சார்ந்த உற்பத்திப் பொருட்களிலுள்ள ஈயம் (Pb) கட்மியம் (Cd) மற்றும் இரசம் (Hg) என்பவற்றின் உச்ச வரம்புகள்–

(1) தகுதிவாய்ந்த அதிகாரி மீன் மற்றும் மீன் சார்ந்த உற்பத்திப்பொருட்களில் ஈயம் (Pb) கட்மியம் (Cd) அத்துடன் இரசம் (Hg) என்பவற்றின் செறிவுக்கான பெறுமதிகளை நிர்ணயிக்கையில் ஏற்றுக்கொள்ளத்தக்க அதிகபட்ச வரம்புகளாக "அதிகபட்ச மட்டம்" என்ற நிரையின்கீழ் காணப்படும் பெறுமதிகளை கருத்திற்கொள்ளுதல் வேண்டும் என்பதுடன் கீழே குறித்துரைக்கப்பட்ட உற்பத்திப் பொருட்கள் "அதிகபட்ச மட்டம்" என்பதில் தரப்பிட்டுள்ளதைவிடக் கூடுதலான மட்டங்களைக் கொண்டிருத்தலுமாகாது."

| | உற்பத்திப்பொருள் | ஆகக்கூடிய மட்டம் (ஈர நிறை மில் கி./ கி.கி.) |
|---|---|---|
| ஈயம் (Pb) | கீழ் குறிப்பிடப்படும் மீன் இனங்கள் தவிர்ந்த ஏனைய மீன் இனங்களின் தசைகள் (1) (2) : | 020 |
| | கீழ் குறிப்பிடப்படும் மீன் இனங்களின் தசைகள் (1) (2) :<br>(1) கொமன் டூ பண்டட் சீ பிரீம் (டிப்ளோடஸ் வல்காரிஸ்)<br>(2) விலாங்கு (அன்குயீலா அன்குயீலா)<br>(3) கிறே முலாட் (முகில் லப்ரோசஸ் லப்ரோசஸ்)<br>(4) க்ரன்ட் (பொமாடேசிஸ் பினெட்)<br>(5) ஹோர்ஸ் மெக்கரல் அல்லது ஸ்கெட் (ட்ரச்சுரஸ் ட்ரச்சுரஸ்)<br>(6) சாடின் (சாடினா பில்சாடஸ்)<br>(7) சாடிநோப்ஸ் (சாடிநோப்ஸ் இனம்)<br>(8) ஸ்பொட்டட் சீபாஸ் (டயிசென்ராவஸ் பன்க்டேடஸ்)<br>(9) வெஜ் சோல் (டயிகொலொக்லோயா பன்க்டேடஸ்) | 0.40 |
| | நண்டுகளின் கபில நிற தசை மற்றும் சிங்கி இறால் மற்றும் அதனையொத்த க்ரஸ்டியாக்களின் (நெப்ரோசிடோ மற்றும் பெலிநியுரிடோ) தலை, தோல் தசை தவிர்ந்த | 0.50 |
| | இரு ஓடுடைய மொலஸ்கா | 1.50 |
| | செபலோபோடாக்கள் (உள்ளுறுப்புகள் அற்றவை) | 1.00 |
| கட்மியம் (Cd) | கீழ் குறிப்பிடப்படும் அட்டவணைப்படுத்தப்பட்டுள்ள மீன் இனங்கள் தவிர்ந்த ஏனைய மீன் இனங்களின் தசை (1) (2) : | 0.05 |
| | கீழ் குறிப்பிடப்படும் மீன் இனங்களின் தசை (1) (2) :<br>(1) அன்சொவி (என்க்ரோலிஸ் இனம்)<br>(2) பொனிட்டா (சாடா சாடா)<br>(3) கொமன் டூ பென்டட் சீ ப்ரீம் (டிப்ளோடஸ் வல்காரிஸ்)<br>(4) விலாங்கு (அஞ்சுள்ளா அஞ்சுள்ளா)<br>(5) கிரே முலட் (முகில் லப்றொசஸ் லப்ரோசஸ்)<br>(6) ஹோரஸ் மக்கரல் அல்லது ஸ்கெட் (டரச்சுரஸ் டரச்சுரஸ்)<br>(7) லோவா (ர்) அல்லது லுவர் (லூவாரஸ் இம்பீரியாலிஸ்)<br>(8) சார்டின் (சாடினா பில்வாடஸ்)<br>(9) சாடினொப்ஸ் (சாடினொப்ஸ் இனம்)<br>(10 டூனா (துன்னுஸ், இயுதித்திஸ் இனம், கட்டுகவோனஸ் பெலாமிஸ்)<br>(11) வெஜ் சோல் (டயிகொலகொக்லோசா குனீசட்டா) | 0.10 |
| | சுவேடி பிஸ் (கடு கொப்பரா) தசை (க்சிபியஸ் க்லாடியஸ்) | 0.30 |
| | நண்டுகளின் கபில நிற தசை மற்றும் சிங்கி இறால் மற்றும் அதனையொத்த க்ரஸ்டியாக்களின் (நெப்ரோசிடோ மற்றும் பெலிநியுரிடோ) தலை, தோல் தசை தவிர்ந்தவை | 0.50 |
| | இரு ஓடுடைய மொலஸ்காகள் | 1.00 |
| | செப்லோபோடாக்கள் (உள்ளுறுப்புகள் அற்றவை) | 1.00 |

| | உற்பத்திப்பொருள் | ஆகக்கூடிய மட்டம் (ஈர நிறை மில் கி./ கி.கி.) |
|---|---|---|
| இரசம் (Hg) | கீழ் குறிப்பிடப்படும் அட்டவணைப்படுத்தப்பட்டுள்ள மீன் இனங்கள் தவிர்ந்த ஏனைய மீன் இனங்களின் தசை [1] [2] : | 0.50 |
| | கீழ் குறிப்பிடப்படும் மீன் இனங்களின் தசை [1] [2] :<br>(1) அங்க்லர் பிஸ் லோசியஸ் இனம்<br>(2) அத்லாந்திக் கட் பிஸ் (அனாகிவஸ் லூப்பஸ்)<br>(3) பொனிட்டோ (சாதா சாதா)<br>(4) விலாங்கு (அன்குயீலா அன்குயீலா)<br>(5) எம்பர (ர்) ஒரேன்ஞ் ரபி (1), ரோஸி சோல்ஜர் பிஸ் ஹோஸப்லொஸ்ட்டிதஸ் இனம்)<br>(6) க்ரன்டிய (ர்) (கொரிசிநொயிடிஸ் ரூபெஸ்ட்டிஸ்)<br>(7) ஹெலிபட் (ஹிபொக்லோசஸ் ஹிபொக்லோசஸ்)<br>(8) மா(ர்) லின் (மெக்கசிரா இனம்)<br>(9) ம(ர்)க்கிரீம் (லெபிடொஹோம்பஸ் இனம்)<br>(10 முலட் (முலட் இனம்)<br>(11) பயிக் (எசொக்ஸ் லுசியஸ்)<br>(12) ப்லேன் பொனிட்டோ (ஒஸினொப்சிஸ் யுனிகொல(ர்))<br>(13) புவர் கொட் (ப்ரிகோப்டொஸ் மினுட்டிஸ்)<br>(14) போட்டுகூஸ் டொக் பிஸ் (சென்ட்ரோ சிமனஸ் கோலொலெபிஸ்)<br>(15) றேயிஸ் (ராஜா இனம்)<br>(16) ரேட்பிஸ் (செபாஸ்ட்டஸ் மெரினஸ், செபாஸ்ட்டாஸ் மெட்டிலா, செபாஸ்ட்டாஸ் விவிபெரல்)<br>(17) சேயில் பிஸ் (இஸ்ட்டிசோபரஸ் ப்ளட்டிப்டெரஸ்)<br>(18) சப்பாட் பிஸ் (லெபிடோபஸ் கோடரட்டஸ் அப்பனெபஸ் கா(ர்)போ)<br>(19) சீ க்றீம், பென்டோரா (பெஜலஸ் இனம்)<br>(20) சுறா (சகல இனங்களும்)<br>(21) ஸ்னேக் மெக்கரல் அல்லது பட்டர் பிஸ் (ப்ரிட்டியோசஸ், ஜேம்பிளஸ் சேர்பென்ஸ்)<br>(22) ஸ்ட்டர்ஜ (அயிபென்சர் இனம்)<br>(23) ஸ்வோடிஸ் பிஸ் (க்சிபியஸ் க்ளாடியஸ்)<br>(24) டூனா (துன்னுஸ், இயுதித்திஸ் இனம், கட்டுசுவோனஸ் பெலாமிஸ்) | 1.00 |

([1]) மீன்களை முழுமையாக உணவாக உட்கொள்ள உத்தேசிக்கப்படுமிடத்து உச்ச வரம்பு முழு மீனுக்கும் ஏற்புடையதாதல் வேண்டும்.

([2]) உயிருள்ள மீன், புதிய அல்லது குளிரூட்டப்பட்ட மீன், அதி குளிரூட்டப்பட்ட மீன், மீன் துண்டுகள் மற்றும் வேறு மீன் தசை (அரைக்கப்பட்ட அல்லது அரைக்கப்படாத) புதிய குளிரூட்டப்பட்ட அல்லது அதி குளிரூட்டப்பட்ட மீன்).

([3]) உயிருள்ள மீன், புதிய அல்லது குளிரூட்டிய மீன், அதி குளிரூட்டப்பட்ட மீன், மீன் துண்டுகள் மற்றும் வேறு மீன் தசை (அரைக்கப்பட்ட அல்லது அரைக்கப்படாத) புதியது.

குளிரூட்டப்பட்ட அல்லது அதி குளிரூட்டப்பட்ட புறவன்கூட்டுடன் கூடிய அல்லது அல்லாத உயிருள்ள, புதிய, குளிரூட்டிய, உலர்த்திய, உப்பிட்ட அல்லது உப்பு நீரிலிட்ட கிறஸ்டேசியாரக்கள், புறவன்கூடு கொண்ட ஆவியில் அல்லது கொதி நீரில் சமைக்கப்பட்ட, குளிரூட்டிய, அதி குளிரூட்டிய உலர்த்திய, உப்பிட்ட அல்லது உப்பு நீரிலிட்ட அல்லது அவ்வாறு செய்யப்படாத கிறஸ்டேசியாக்கள், மனித நுகர்வுக்குப் பொருத்தமான மீன்களின் மாவு, மீன் உணவு (உணவு அல்லது சிறு உருண்டை (பெலட்).
புறவன்கூடு கொண்ட அல்லது இல்லாத உயிருள்ள புதிய குளிரூட்டிய, அதி குளிரூட்டிய, உலர்த்திய, உப்பிட்ட அல்லது உப்பு நீரிலிட்ட மொலஸ்காக்கள் கிரஸ்டேசியாக்கள், தவிர்ந்த பிற நீர்வாழ் முள்ளந்தண்டிலிகள் மனித நுகர்வுக்குப் பொருத்தமான மாவு, உணவு மற்றும் சிறு உருண்டை (பெலட்).
பதனிட்ட அல்லது பேணப்பட்ட கிறஸ்டேசியரக்கள், மொலஸ்காக்கள் மற்றும் ஏனைய முள்ளந்தண்டிலிகள்.

(2) மீன் சார்ந்த உற்பத்திப் பொருட்களினுள் இருக்கக்கூடிய, ஈயம், கட்மியம் மற்றும் இரசம் ஆகிய மூலங்களின் மட்டத்தை உத்தியோகபூர்வமாகக் கட்டுப்படுத்துவதற்கு மாதிரிகள் பெற்றுக் கொள்ளும் முறை.

**(அ) நோக்கம் மற்றும் நோக்கெல்லை :**

மீன் உற்பத்திகளில் இருக்கக்கூடிய ஈயம், கட்மியம் மற்றும் இரசம் ஆகிய மூலகங்களின் மட்டத்தை உத்தியோகபூர்வமாகக் கட்டுப்படுத்துவதற்கு பெற்றுக்கொள்ளப்படும் மாதிரிகள் கீழே விவரிக்கப்படும் முறைக்கு இணங்க பெற்றுக்கொள்ளப்படல் வேண்டும். அதற்கமைய பெற்றுக் கொள்ளப்படும் மாதிரித் தொகுதி, அம்மாதிரிகளைப் பெற்றுக் கொண்ட தொகைகளின் அல்லது உட்தொகைகளின் உருவகையாகக் கருதப்படுதல் வேண்டும். இவ்வொழுங்குவிதிகளில் விதித்துரைக்கப்பட்ட அதிகபட்ச மட்டங்களுடன் இணங்கியொழுகுதலானது ஆய்வுகூட மாதிரிகைகளில் நிர்ணயிக்கப்பட்ட மட்டங்களின் அடிப்படையில் நிலைநாட்டப்படுதல் வேண்டும்.

**(ஆ) வரைவிலக்கணங்கள் :**

1. *தொகை* : முதல்நிலை, வகை, பொதியின் தன்மை, பொதிசெய்பவர், ஏற்றுமதியாளர், அல்லது அடையாளக் குறிபோன்ற பொதுக் குணங்கள் இருத்தலின் அடிப்படையில் அங்கீகாரம் பெற்ற அலுவலர் ஒருவரினால் தீர்மானிக்கப்பட்ட இனம் காணக்கூடிய மற்றும் ஒரு சந்தர்ப்பத்தில் விநியோகம் செய்யப்படும் உணவு தொகுதி கையிருப்பு எனப்படும். மீன்கள் விடயத்தில் மீன்களின் பருமனும் ஒன்றுக்கொன்று ஒத்ததாக இருத்தல் வேண்டும்.

2. *உட்தொகை* : மாதிரிகளைப் பெற்றுக் கொள்ளும் முறையை குறித்தொதுக்கப்பட்ட பகுதி ஒன்றிற் பிரயோகிக்குமுகமாக பெரிய தொகுதிக்கு தெரிவுசெய்யப்பட்ட அத்தகைய உட்தொகுதி வேறாக இருக்க வேண்டியதோடு உருப்படி ரீதியில் பிரத்தொதுக்கப்படும் இனங்காணக்கூடியதாகவும் இருத்தல் வேண்டும்.

3. *மிகையீட்டு மாதிரிகை* : தொகையில் அல்லது உட்தொகையில் தனியொரு இடத்திலிருந்து எடுக்கப்பட்ட பொருளின் தொகையளவு.

4. *கூட்டுமொத்த மாதிரிகை* : தொகையில் அல்லது உட்தொகையிலிருந்து எடுக்கப்பட்ட எல்லா மிகையீட்டு மாதிரிகளினதும் கூட்டுமொத்தம்.

5. *ஆய்வுகூட மாதிரிகை* : ஆய்வுகூட பரிசோதனைக்கென உத்தேசிக்கப்பட்ட மாதிரிகை.

**(இ) பொது ஏற்பாடுகள் :**

1. *ஆளணியினர் :*

மாதிரியைத் தேர்ந்து ஆராய்தலானது தகுதி வாய்ந்த அதிகாரியால் குறித்துரைக்கப்பட்டவாறு அதிகாரமளிக்கப்பட்டவரான தகுதிவாய்ந்த ஆளொருவரால் மேற்கொள்ளப்படுதல் வேண்டும்.

2. *தேர்ந்து ஆராயப்படவேண்டிய பொருட்கள் :*

தேர்ந்து ஆராயப்படவேண்டிய மாதிரிபொருளின் தொகை ஒவ்வொன்றும் வெவ்வேறாக ஆராயப்படுதல் வேண்டும்.

3. *எடுக்கப்பட வேண்டிய முற்பாதுகாப்புகள் :*

எடுக்கப்படவேண்டிய முற்பாதுகாப்புகள் மாதிரியைத் தேர்ந்து ஆராயும்போதும் ஆய்வுகூட மாதிரிகையைத் தயாரிக்கும்போதும் ஈயம், கட்மியம், இரசம் என்பவற்றின் செறிவை மோசமாகப் பாதிக்கும் அத்துடன் பகுப்பாய்வு சார்ந்த தீர்மானத்தைப் பாதிக்கும் அல்லது கூட்டுமாதிரிகை மூலப்பண்பை சரிவரக் காட்டாதிருக்கச் செய்யும் எவையேனும் மாற்றங்களைத் தவிர்ப்பதற்கு அனைத்து முற்பாதுகாப்பு நடவடிக்கைகளும் எடுக்கப்படுதல் வேண்டும்.

4. *மிகையீட்டு மாதிரிகள் :*

மிகையீட்டு மாதிரிகைகள் சாத்தியப்படக்கூடிய அளவுக்கு தொகை அல்லது உட்தொகை முழுவதும் பரந்துள்ள பல்வேறு இடங்களிலிருந்து எடுக்கப்படுதல் வேண்டும். இந்த நடைமுறையிலிருந்து விலகிச் செல்லுதலானது 8 ஆம் விடயத்தின் கீழ் தரப்பட்டுள்ள பதிவேட்டில் பதியப்படுதல் வேண்டும்.

5. *கூட்டுமொத்த மாதிரிகள் தயாரித்தல் :*

அனைத்து மிகையீட்டு மாதிரிகைகளையும் ஒன்றுதிரட்டியே கூட்டுமொத்த மாதிரிகள் தேர்ந்து ஆராயப்படுகின்றன. அது சாத்தியப்படக்கூடிய அளவுக்கு குறைந்தபட்சம் 1 கிலோ கிராம் இருத்தல் வேண்டும்.

6. வலுவுக்கிடல், பாதுகாப்பு மற்றும் ஆற்றுப்படுத்துகை ஆகிய நோக்கங்களுக்கு ஆய்வுகூட மாதிரிகைகளிலுள்ள கூட்டுமொத்த மாதிரிகையின் உட்பிரிவு.

வலுவுக்கிடல், வியாபாரம் (பாதுகாப்பு) ஆற்றுப்படுத்துகை ஆகிய நோக்கத்திற்கு, மாதிரிகைகளைத் தேர்ந்து ஆராய்தல் தொடர்பான ஒழுங்குவிதிகளுடன் இது முரண்பட்டாலன்றி ஒரே இனத்தினதாக்கப்பட்ட கூட்டுமொத்த மாதிரிகையிலிருந்து எடுக்கப்படுதல் வேண்டும்.

7. கூட்டுமொத்த மற்றும் ஆய்வுகூட மாதிரிகைகளை சிப்பம் செய்தலும் அனுப்புதலும்:

கூட்டுமொத்த மற்றும் ஆய்வுகூட மாதிரிகை ஒவ்வொன்றும் கொள்கலனின் உட்புறச் சுவரால் உறிஞ்சப்படுவதன் மூலம் மாசு அடைவதினின்றும் பகுப்பாய்வு சார்ந்த குணாதியசங்கள் இழக்கப்படுவதினின்றும் இடைப்போக்கிலான சேதத்திற்கெதிராகவும் போதியளவு பாதுகாப்பளிக்கும் சுத்தமான சடத்தன்மையுள்ள கொள்கலனில் வைக்கப்படுதல் வேண்டும். போக்குவரத்தின்போது அல்லது களஞ்சியப்படுத்தும்போது கூட்டுமொத்த மற்றும் ஆய்வுகூட மாதிரிகைகளின் சேர்வையின் மாற்றத்தைத் தவிர்ப்பதற்கு அனைத்து முற்பாதுகாப்புகளும் மேற்கொள்ளப்படுதல் வேண்டும்.

8. கூட்டுமொத்த மற்றும் ஆய்வுகூட மாதிரிகைகளைப் பொறியிடுதலும் அவற்றிற்கு சுட்டுத்துண்டிடுதலும் :

அலுவலக முறையான பாவனைக்கு எடுக்கப்படும் மாதிரிகை ஒவ்வொன்றும் தேர்ந்து ஆராயப்படுமிடத்தில் பொறியிடப்படுதலும் பின்வரும் ஒழுங்குவிதிகளின் தேவைப்பாடுகளைப் பின்பற்றி இனம் காணப்படுதலும் வேண்டும். ஒவ்வொரு தொகையையும் தனித்தனியாக இனம் காண வசதியளிக்கக்கூடியதாக மாதிரிகை தேர்ந்து ஆராயப்பட்ட திகதியையும் இடத்தையும் பகுப்பாய்வாளருக்கு உதவக்கூடிய சாத்தியமுள்ள ஏதேனும் மேலதிக தகவலையும் தருகின்ற ஒவ்வொரு ஆராய்வினதும் பதிவேடொன்று வைத்திருக்கப்படுதல் வேண்டும்.

(ஈ) **தேர்ந்து ஆராயும் திட்டம் :**

